

# මව් පෙමින් සුරකිමු පරිසරය

සුපුල් කුසුම් රොන් තුරුලිය දෙන සිසිල
සිහිල් පවන් රැළි නදියක දිය නිමල
ළදල් ලකින් ලදහැකි සුව අසල දොල
සියල් සැපත් විදි සරිවේ සසර කල

ඇතුන් මුවන් සා වලසුන් කැළ විහග
නුවන් පිනයි අම රස සේ තැබූ තොලග
පවන් රොදට මුසු වූ බිඟු නද සමග
නිරන්තරෙන් ගෙන යයි අප වෙතට සග

නසන්නෙකුට වූ කුළුණින් දෙන සෙවණ
පසන් ගුණෙන් යුතු කවුරුද ගස පමණ
කටෙන් මරුගෙ රැක ගන්නට සතුන පණ
හපන් ඕසුව දිය බිඳ මිස වෙන කුමන

කුරුල් ලෙකුගෙ කූඩුව තුළ රැදුණු පෙම
ඇසිල්ලකින් රැඳි රුක හා වැටෙයි බිම
මුදල් ලොබින් බල මිනිසගෙ අමන කම
මඟුල් ජයයි මත පරිසර සොහොන් බිම

බුදුන් ලොවෙන් අග නැණ ලද ඇසතු මුල
නුවන් බැලුම් පුද ලදි සත් දිනක් කල
ලෙසින් රැකෙන ගජමුතු තුළ ඇතුන් දළ
යෙහෙන් රකිමු දිය, තුරුලිය සතුන් කැළ

කේ. ඒ. සාරංග ඉඳුනිල්
13 ශ්‍රේණිය,
චින්සෙග් බෞද්ධ විද්‍යාලය,
නව නගරය,
මුල්ලේරියාව.